මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/86**

**2024.09.17**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම අවසන් බව දැන්වීම

2024 ජනාධිපතිවරණයේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා අදාළ ගෘහ වෙත තැපැලෙන් බෙදාහැරීමේ කටයුතු 2024.09.14 දින අවසන් කර ඇත. නිල ඡන්ද දැන්වීම් පත් නොලැබුණු ඡන්ද හිමියන්ට 2024 සැප්තැම්බර් මස 18, 19 සහ 20 දිනවල ඔවුන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ලිපිනයට අදාළ ප්‍රදේශයේ තැපැල් කාර්යාලය වෙත ගොස් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව තම ගෘහයට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් ලබා ගැනීමට හැකියාව පවතී.

නිල ඡන්ද දැන්වීම්පතක් නොලැබුණු ඡන්ද හිමියන්ට නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවේ පිටපතක් පහත පියවර අනුගමනය කිරීමෙන් මාර්ගගත ක්‍රමයට ලබාගැනීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් පහසුකම් සලසා තිබේ.

- https://eservices.elections.gov.lk යන මැතිවරණ ඉ - සේවා වෙබ් අඩවියට පිවිසීම;
- එහි **පුරවැසියන් සඳහා** වන යොමුවෙන් ඡන්දහිමි ලියාපදිංචි තොරතුරු සෙවුම යන ඉ - සේවාව වෙත යොමුවීම;
- ජාතික හැඳුනුම්පත් අංකය යොදා තොරතුරු සෙවීම;
- ඒ අනුසාරයෙන් ලැබෙන තොරතුරු අතරින් **මැතිවරණය සඳහා ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු ජනාධිපතිවරණය - 2024** වෙත පිවිසීම;
- එවිට 2024 ජනාධිපතිවරණය සඳහා භාවිතා වන නාමලේඛනයේ ඔබගේ ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු දිස්වේ;
- එයට පහළින් ඔබේ ජංගම දුරකථන අංකය ඇතුළත් කර **ඡන්ද දැන්වීම් පත්‍රිකාව මුද්‍රණය** මගින් නිල ඡන්ද දැන්වීම් පත්‍රය බාගත කර ගැනීම සඳහා යොමුවීම; සහ
- ඒ සමඟම ඔබගේ ජංගම දුරකථනයට කේතයක් ලැබෙන අතර, එම කේතය " **Enter the code**"යනුවෙන් දිස්වන ස්ථානයට ඇතුළත් කර ඔබගේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව බාගත කර ගැනීමට; පුළුවන.

**එසේම ඡන්ද හිමියන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිල ඡන්ද දැන්වීම්පත අනිවාර්ය අවශ්‍යතාවක් නොවන අතර, 2024 ඡන්දහිමි නාමලේඛනයේ නම සඳහන් වලංගු හැඳුනුම්පතක් සහිත ඕනෑම ඡන්ද හිමියෙකුට තමාට වෙන්කර ඇති ඡන්ද පොළ වෙත ගොස් අනන්‍යතාව සනාථ කිරීම ප්‍රමාණවත් බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.**

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්)